ලේකම් / செயலாளர் / Secretary
දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447

E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785

Web Site: www.moj.gov.lk


# අධිකරණ අමාත්‍යාංශය

# நீதி அமைச்சு

# MINISTRY OF JUSTICE


ටෙලිමේල් / Tele / ரெலிமெயில் — අධිකරණ ලේකම් / நீதிச்செயலாளர் / Secminjust
තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රෝනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.lk
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12
மீயுயர் நீதிமன்ற கட்டிடத்தொகுதி
கொழும்பு 12
Superior Courts Complex,
Colombo 12.


මගේ අංකය / எனது இல / My No. MOJ/Media/Relese/61 | ඔබේ අංකය / உமது. இல. / Your No. | දිනය / Date

ප්‍රවෘත්ති කර්තෘ/අධ්‍යක්ෂක 2021.04.03

**විශේෂ මාධ්‍ය නිවේදනයයි**

හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් සමාජය තුළ වැරදි මතයක් ප්‍රචාරය කිරීමට ඇතැම් කණ්ඩායම් උත්සාහ කරන බව පෙනී ගොස් ඇත.

ඒ සම්බන්ධව පවතින නිවැරදි තත්වය පැහැදිලි කිරීම මෙම නිවේදනයේ අරමුණයි. අලුතින් හදිසි මරණ පරීක්ෂක (මුස්ලිම්) තනතුරක් ඇති කිරීමට සූදානමක් පවතින බවට ගෙන යන ප්‍රචාරයේ කිසිදු සත්‍යතාවයක් නොමැති අතර ඒ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් කිසිදු තීරණයක් ගෙන නොමැත.

පුරප්පාඩු වී ඇති හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපත්තිමය තීරණයක් හෝ වෙනත් නියෝගයක් වර්තමාන අධිකරණ අමාත්‍යවරයා විසින් නිකුත් කොට නොමැති අතර සිදු වී ඇත්තේ දැනට ස්ථාපිත කර ඇති තනතුරුවල පුරප්පාඩු ඇති වන අවස්ථාවලදී මෙතෙක් පැවති සාමාන්‍ය ක්‍රියාපටිපාටිය යටතේ අයදුම්පත් කැඳවා පුරප්පාඩු පිරවීමේ සාමාන්‍ය ක්‍රියාවලියක් පමණක් වේ.

2018 වර්ෂයේදී හදිසි මරණ පරීක්ෂවරුන්ගේ කාර්යභාරය වඩා කාර්යක්ෂම කිරීම සඳහා එවකට සිටි අධිකරණ අමාත්‍යවරිය විසින් අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු යටතේ පත් කරන ලද විශේෂඥ කමිටුවේ නිර්දේශය අනුව විවිධ ගැටලු හඳුනා ගෙන ඇත. පැය 24 ක කාලයක් තුළදී මුස්ලිම් ජනතාවගේ භූමදාන කටයුතු සිදු කළ යුතු බැවින් මරණ පරීක්ෂකවරුන් කාර්යාල කාල සීමාවන් තුළදී පමණක් රාජකාරි කිරීම හේතුවෙන් ගැටලු මතුවන බව 2018 වර්ෂයේ දී පත් කරන ලද එම කමිටුවේ නිර්දේශයන් අතර විය. ඒ අනුව 2018 වර්ෂයේ දී පත් කරන ලද එම කමිටුව විසින් යෝජනා කර තිබුණේ බහු වාර්ගික ප්‍රාදේශීය බල ප්‍රදේශ 88 ක් සඳහා බහුජන වර්ග නියෝජනය වන පරිදි හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීම යෝග්‍ය බවයි.

ඒ අනුව දැනට ස්ථාපිත කර ඇති තනතුරුවල පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදී මෙතෙක් පැවති සාමාන්‍ය ක්‍රියාපටිපාටිය යටතේ පුරප්පාඩු පිරවීම හැර කිසිදු තනතුරක් අලුතින් ඇති කිරීම හෝ ඒ සඳහා නියෝගයක් නිකුත් කිරීමට වර්තමාන අධිකරණ අමාත්‍යවරයා විසින් පියවර ගෙන නොමැති බව ඉතා වගකීමෙන් අවධාරණය කර සිටිමි.

චමිල විජේසේකර
මාධ්‍ය ලේකම්
අධිකරණ අමාත්‍යාංශය